

# සංක්‍රමණිකයකුගේ සටහන

## සොඳුරු සැඳෑවක්



සිංහල ගීත කලා ක්ෂේත්‍රය තුල ගායකයාට ගීත රචකයාටත් සංගීතඥයාටත් වඩා ජන ප්‍රසාදයක් හා ප්‍රතිරූපයක් ගොඩ නැගී ඇත. ඒ සිනමාව තුල නම් නිලියනට රූපය සේම ගායික ගායකයන්ට සිය කටහඬ අලෙවි කල හැකි බැවිනි. එය දුක් ගන්නාරාළ හා භාතිය සංතුෂ්ට සේම සුනිල් සරත් හෝ අජන්ත රනසිංහ හා අමරදේව හෝ වික්ටර් සනත්ටද අදාල වේ. ඒ අනුව සමාජය තුල වැඩි වරප්‍රසාද හා ප්‍රතිරූප ගොඩනගා ගනිමින් බැබලෙන්නේ ගායික ගායකාවන්ය. සැබෑ ලෙසම ඒ ගොඩ නැගෙන ප්‍රතිරූප වල සැබෑ නිමැවුම් කරුවන් නිහඬව තමන්ගේ කාරිය කරවමින් සිටිති. එසේ නිහඬව සමාජයේ සතුට වෙනුවෙන් වෙහෙසෙන පරපුරකට අයත් සොඳුරු මිනිසෙකුගේ උත්සහයක් දොරට වඩින උත්සවයකට පසුගියදා අපට එක්වන්න හැකි උනා. මිනිස්සු බොහෝ විට හොඳ දේ අඳුනාග න්නේ ඉවකින් වගේ. උත්සවයට පැමිණ සිටි ජනතාවගෙ ප්‍රමාණය ඊට හොඳම නිදසුනක් උනා. රසවත් අර්ථවත් සැඳෑවක මිහිර අප සියළු දෙනාම විඳගත්තා. ඒ සොඳුරු මිනිසා සිසිර ගැන බොහෝ දෙනා දන්නා බැවින් සටහන් අවශ්‍ය වෙන්නේ නැහැ. තව බොහෝ දුර ගමනක් යන්නට සිටින සිසිරගෙන් සුහද ඉල්ලීමක් කරමින් සමුගන්නම්. දයාබර සිසිර සත්‍ය ලෙසම ඔබගේ අනන්‍යතාවය මව්රටේත් මෙහේත් ගොඩනැගී දැන් හමාරය. ඔබගේ ගේය පද රචනා තුලින් බැබලෙන මෙල්බන් ගායික ගායිකාවන් වෙනුවෙන් ඉඩක් ඔබගේ මීලඟ සංගත තැටියේ දී වෙන් කරනු ඇතැයි අපේක්ෂා කරනවා.

## රේඩියෝ සටන් !



ගුවන් විදුලි මහගෙදර යලිත් වන්දෙකට සැරසෙන බව ආරංචි. මෙවර සටන අමුතු මුහුනුවරක් ගෙන ඇති බවක් කියවෙනවා. ඒකට පත්වෙන කට්ටිය හඳුන්න බැරි වෙන එක වෙනම කාරනාවක්. ඒත් ඒක පොදු දේපලක් මිනිස්සුන්ගෙ ආධාර මත ගොඩ නැගුන තැනක්. ඒක එක එක පුද්ගලයන්ගෙ කල්ලි වල පටු අරමුනු ඉටුකර ගන්න හදන තැනක් බවට පත්විය යුතු නැහැ. එකටත්, ටෙක් එකටත්, සිංහල සංගමයටත් ඒක අදාලයි. කොයි කවුරු ගත්තත් මෙතුවක් කල් නම් පත් වුනු කමිටු වල නියොජ්‍යත්වයේ විවිධත්වයක් තිබුනා. ඒ නිසා පටු අරමුනු ඉටු කරගත නොහැකි වූවා මෙන්ම ඒවා පරාජය කිරීමට ද ඉඩක් තිබුනා. ඒත් මේවා තමන්ගෙ සුවිශාල සාමාජිකත්වය ඉස්සරහට දමමින් විවිධ නියෝජනය ඉවතට දමා ඒකාධිකාරී ඒකපාර්ෂික පාලන කමිටුවක් ගොඩනගා ගැනිමට අර අදින බව ආරංචිය. මිත්‍රවරුනි ඒක නරක ආදර්ශයක් ප්‍රමානාත්මක භාවයට වඩා ගුනාත්මක බවට මුල් තැන දෙන්න. ගුවන්විදුලියකින් සිදුවිය යුත්තේ සමාජයක් ගොඩනැගීම මිස බිඳ දැමීම නොවේ.

## අපි බලන් ඉමු



රටේ මුදල් පරිපාලනයේ ලොක්කා ශ්‍රෙෂ්ඨාධිකරනයෙන් වංචාවකට වැරදි කරුවෙක් කරලා රජයේ දේශපාලන අයථා ලෙද පුද්ගලික අංශයට විකිනීම සම්බන්ධව ලක්ෂ ගනනක දඩයකුත් නියමවෙලා. ඒත් කිසිම අවුලක් නැහැ අගේට ඉන්නවා. එයත් එක්ක තව රටේ ප්‍රධාන ඇමති ජෝඩුවකුත් මාට්ටු වෙලා. ඒ කට්ටියට නම් වගක්වත් නැහැ. මේ නියෝග ලැබුනෙ පහල උසාවියකින් හේම නෙවෙයි. පොල් ගෙඩියක් සොරා ගත් මිනිහෙකුව කූදලන් ගිහින් කූඩුවට දාන පොලීසියත් රු 100ක් සන්තෝසමක් ගන්න කාර්යාල ලිපිකරුවෙකුගෙ වැඩ තහනම් කරලා අල්ලස් කොමිසමත් දැන් ක්‍රියා කරන්නේ කොහොමද කියලා රටම බලන් ඉන්නවා. මිනිස්සු හීනයක් දකිනවා. මහින්ද මහත්තයගෙ නියමයෙන් අල්ලස් කොමිසම ඇවිත් ලේකම්ගේ හීන් තැනින් අල්ලලා කූඩුවට දාන හැටි ගැන. ඇවිත් බලාගෙන ඉමු මොකද වෙන්නෙ කියලා. දේශප්‍රේමයෙන් වහන කුනුවල ප්‍රමානයේ සීමාවක් තිබිය යුතුය. රට බේරග න්න කොට ඉතිරි වෙන්නෙ ඉන්න එවුන්ගෙ ඇදිවත විතරද ?

## කැත පුරුදු



මෙල්බන් වල ඇති පුස්තකාල වලට ශ්‍රී ලාංකික පොත් පත් සඟරා ආදිය ගෙනත් ඇත්තේ බොහෝ දෙනෙකුගේ මහන්සියේ කැපවීමේ ප්‍රථිඵලයක් ලෙසයි. එසේ පොදු යහපත තකා ගෙනැවිත් ඇති පොත් වල සඟරාවල පිටු ඉරාගෙන තමන් සන්තක කර ගැනීම කැත පුරුද්දක්. විශේෂයෙන් කෑම වට්ටෝරු වල අලංකාර කිරීම ගැන සඳහන් වී ඇති පිටු බොහෝ විට ඉරාගෙන තිබෙනවා. තමන්ට අවශ්‍ය නම් පොත් සඟරා ගෙදර ගෙනැවිත් පිටපත් කර ගැනීම අවශ්‍ය පහසුකම් අපමන ඇති රටන මේ දේවල් නම් කරන්නෙ පුරුද්දටම තමයි. කරුනාකර කවුරුන් හෝ ඒ කැත පුරුද්දෙන් අත් මිදෙන්න.

## ලාල්ගේ සටන



ජූලි 10 වර්ජනය ගැන කතන්දර සේරම දැන් ඉවරයි. කවුරු කොහොම කිව්වත් ලාල් කාන්ත නියම සටනක් දුන්නා. ඇයි අපි එහෙම කියන්නෙ? මිනිස්සු මේ වර්ජනය ගැන කරපු හැටි ගැන ප්‍රතිඵල ගැන දහසක් දේ කියනවා. මේ එක් අයෙක් වත් මේක මහා වැඩ වර්ජනයක් යයි කියනවා මිසක් මේකේ තිබුණ ''සංකේත'' කියන කෑල්ල විහින් අමතක කරනවා. ඒක තනිකරම කුහක කමක්. මිනිස්සු මේක සංකේත වැඩ වර්ජනයක් කියන එක අමතක කරන්නෙ තනිකරම ලාල්ටත් වෘත්තිය සමිති සම්මේලනයටත් මඩ ගහන්න. අඩු පාඩු තිබුණා තමයි. ඒත් ලාල්ලා තනියම හරි දුන්න සටන වටින්නේ රජය ඒකට දක්වපු ප්‍රතිචාරයේ ස්වභාවයෙන්.

රජය දාහක් දුන්නේ කම්කරුවට තියෙන ආදරයටද වර්ජනයේ තර්ජනයේ ප්‍රතිඵලයට ද කියලා මිනිස්සු තේරුම් ගන්න ඕනෙ. රටම රජය කරන හැම දේම අනුමත කරවන ආකාරයට තනි පීල්ලක් මතට ගන්නට උත්සාහ දරන මොහොතක දේශානුරාගයේ රශ්මියෙන් දෑස් අන්ධ වී සිටින මිනිස්සුන්ට ඇස් ඇර බලන්නට හැකි එක් දවසක් හෝ ලබා දීම වටිනවා. කොහොම වුණත් හුදකලා කම්කරු සටන් බොහෝ විට පරාජයෙන් කෙළවර වීම අපි අත්දැක ඇති දෙයක්.

සංකේත පමණක් නොව මහා වැඩ වර්ජනයකදී ද කළයුතු ඊටම අනන්‍ය වූ ක්‍රමවේදයක් තියෙනවා. මේ අනුව ඉදිරි සටන් වලදී පොදු වැඩ පිළිවෙලක් තුළ මෙයට වඩා සාර්ථකව රටේ කම්කරුවන් වෙනුවෙන් යම් අයිතීන් දිනා ගැනීමට හොඳ සටනක් දිය හැකි වේවායි අපි පතනවා. එසේම කවුරු කෙසේ කීවත් ජාතික සේවක සංගමයේ සහයෝගය ලබා ගැනීමම එහි එක් සාධනීය ලක්ෂණයක්. එය එජාපයේ වෘත්තිය සමිතිය වූවාට සමිතිය තුල ගාල් වී සිටින්නේ අලි නොව වැඩ කරන කම්කරුවන්ගෙඑක්තරා කොටසක් බවත් අමතක කළ යුතු නැහැ. මේ සඳහා නිර්භයව ඉදිරිපත් වීම ගැනත් ලාල්ට අපේ ප්‍රසාදය.

සංක්‍රමණිකයා

## මහ තම්පල/ඇත් තම්පල ගසක්



මා රුක් (මහ රුක් පොල්) මාගම් (මහග ම) යන තැන් වල 'ලොකු' යන තේරුම ඇත.

ඇත්තෝර, ඇත්දෙමට යන තැන්වල ඇත්තේත් එම තේරුමමය.

මිහිඳු තලාවම 'මිහින්තලාව' යනුවෙන් තනි පදයක් වේ. එසේම තඹපලාත් තම්පලා - තම්පල වේ. පොල් (කුඩු) පලා, ගිරාපලා, තනපලා යන පද පොල් (කුඩු) පල, ගිරාපල, තනපල යනුවෙන් වෙනස් වී වහරට පැමින නැත .

තඹපෑය ගැළනේවත් නැති කටුතම්පල, කුරු(කූර) තම්පල, එලතම්පලත් අපේ දක්නට ඇත. කුරු කොස් කුරුපොල්, කුරුබල්ලා යන තැන්වල 'කුරු' යනු කුඩා යන තේරුම දේ. කුරුතම්පල යන්න පසුව කූරතම්පල වී ඇතැයි සිතමි.

බටු වව්ලා, බටුමීයා, බටු අලියා (බටු + එලුවා  බැටලුවා) යන තැන්වල බටු යන්නෙහි ඇත්තේ ද 'කුඩා' යන තේරුමය.

ලොකු යන තේරුම දීම සඳහා අපේ බාසාවේ අලි (අලිගෙම්බා) ඇත් (ඇත්තෝර) මහ/මා (මහවෙල මාවව්ලා) පොල් (පොල් අඹ), තඩි (තඩි පිඹුරා) ,යෝද (යෝද රැලිය) වැනි පද යෙදෙන හැටි ඔබ දනිති.

මේ 'ෆොටෝ එකේ ' දැක්වෙන තම්පල ගස ඇත්තේ බටහිර ඕස්ට්‍රේලියාවේ ක්ලෝවඩේල් ශයරියෝය. එය මීටර් 3.6ක් උසය. එහි අටවා ඇති වියන ඔසවා තැබීම සඳහා ඉදි කොට ඇති මුක්කුව මීටර් 3.3 ක් උසය. තම්පල ගස යට සිටින වයසක ලමයා නිසා ගසේ උස සිතා ගත හැකිය. වින්ටරය අවසානයේ තම්පලා ඇට තැන්පත් කල යුතුය. පැල උගුලා යලි සිටුවීම නොලක යුතුය. එවිට වැඩීම බාල වේ. ඔබත් ඇත් තම්පල ගසක් වවා ගැනීමට කැමති වෙතැයි සිතමි.

## මානවඩුගේ මාසය

